## 10. ශීර්ෂය 8 - ජාතික පොලිස් කොමිෂන් සභාව

### 10.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි.

### 10.2 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

වැය විෂයක් සඳහා අධි ප්‍රතිපාදනය සළසා තිබීම හේතුවෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.911,002 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 10.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

#### 10.3.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

#### 10.3.2 අභ්‍යන්තර විගණනය

ජාතික පොලිස් කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

#### 10.3.3 විගණන හා කළමනාකරණ කමිටුව

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

### 10.4 වත්කම් කළමනාකරණය

2014 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා වලින් පෙන්වා දී ඇති පරිදි ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 770(2) සහ 771 (3) ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි.

### 10.5 කාර්ය සාධනය

**පැමිණිලි විමර්ශනය**

ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යාල 11 ක් වෙත සමාලෝචිත වර්ෂයේ දී පහත පරිදි පැමිණිලි 483 ක් ලැබී තිබුණි.

| | පැමිණිල්ලේ ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|---|
| | --------------------------- | ---------- |
| (අ) | පොලීසිය විසින් ක්‍රියානොකිරිම )උදාසීනත්වය( | 206 |
| (ආ) | බලය අයථා ලෙස පරිහරණය | 97 |
| (ඇ) | පක්ෂග්‍රාහීවීම | 127 |
| (ඈ) | වෙනත් | 17 |
| (ඉ) | පහරදීම | 12 |
| (ඊ) | නීතිවිරෝධි ලෙස රදවාගැනීම | 04 |
| (උ) | බොරු චෝදනා කිරීම /සිරභාරයට ගැනීම | 15 |
| (ඌ) | වධහිංසා පැමිණවීම | 01 |
| (එ) | කාන්තාවන්ට හා ළමුන්ට හිංසාකිරිම | 01 |
| (ඒ) | අල්ලස් හා දූෂණ | 02 |
| (ඔ) | පොලිස් අත්අඩංගුවේ දී මියයාම | 01 |
| | | ----- |
| | එකතුව | <u>483</u> |

සමාලෝචිත වර්ෂයේ දී එම පැමිණිලිවලින් 426 ක් හෙවත් සියයට 88 ක් විසදා ඇති බව වාර්තා කර තිබුණි. පොලිස් කොමිෂන් සභාව ඍජුව මැදිහත් වී විසදන ලද පැමිණිළි සංඛ්‍යාව 426 ක් වන අතර අනෙකුත් විසඳුම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) පැමිණිලිකරුවන් විසින් පැමිණිල්ල ඉල්ලා අස්කර ගැනීම.
(ii) පැමිණිලිකරු විමර්ශනයට සහභාගිවීම සදහා දිගින් දිගටම නොපැමිණිම.
(iii) විමර්ශනයේ දී අධිකරණමය ක්‍රියාමාර්ගයක් ගෙන තිබෙන බව අනාවරණය වීම.
(iv) විමර්ශනයේ දී පොලිසිය යථා පරිදි ක්‍රියාකර ඇති බව අනාවරණය වීම.
(v) ජාතික පොලිස් කොමිෂන් සභාව මගින් වාර්තා කැදවූ විට පොලිස් නිලධාරින් වැරදි ලෙස ක්‍රියාකර ඇති බව අනාවරණය විම නිසා පොලිසීය මගින්ම විනය කටයුතු ඇරඹිම.
(vi) පොලිස් ක්‍රියාමාර්ග ප්‍රමාද වී ඇති විට ජාතික පොලිස් කොමිෂන් සභා විමර්ශනය නිසා විමර්ශන කටයුතු කඩිනම් කර පොලිසිය මගින්ම අවශ්‍ය පියවර ගැනීම.
(vii) පාර්ශවකරුවන් පොලිසීයේ දී සමථයකට පත්වී ඇති බව විමර්ශනයේ දී අනාවරණය වීම.
(viii) විමර්ශනයේ දි පැමිණිල්ල ජාතික පොලිස් කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නොවන බව පෙනීයාම.
(ix) විමර්ශනයේ දී පැමිණිල්ල සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම.
(x) පැමිණිලිකරුවන් එකවර පැමිණිල්ල පොලිස්පති ඇතුළු වෙනත් බලධාරින් වෙත ඉදිරිපත් කර ඇති අවස්ථාවලදී එකී බලධරයන් කටයුතු කර ඇති බව ජාතික පොලිස් කොමිෂන් සභාවේ විමර්ශනයේ දී අනාවරණය වීම.
(xi) පොලිස් නිලධාරීන් විසින් වරද සිදුකර ඇති බව ජාතික පොලිස් කොමිෂන් සභා විමර්ශනයේ දී අනාවරණය වී ඇති විට ඒ අනුව කරන ලද දැන්වීම් මත පොලිස්පති විසින් විනය ක්‍රියාමාර්ග ගැනීම.

## 10.6 ඵලදායී නොවන ගනුදෙනු

-------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වන ව්‍යවස්ථා සංශෝධනය අනුව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල දහඅටවන ව්‍යවස්ථා සංශෝධනය නිසා අහිමි වී තිබුණි. එම හේතුව නිසා සමාලෝචිත වර්ෂයේදී ජාතික පොලිස් කොමිෂන් සභාව වැය කර තිබුණු එකතුව රු.42,938,271 ක් වූ පුනරාවර්තන සහ මූලධන වියදම් ප්‍රමාණය නිසි ඵලදායකත්වයෙන් යුතුව යොදා ගැනීමට නොහැකි වී තිබුණි.

## 10.7 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | | | - |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 15 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | - | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 33 | 27 | 06 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 13 | 12 | 01 |
| | | **64** | **54** | **10** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට තනතුරු 10 ක් සඳහා පුරප්පාඩු පැවතුණි.

(ආ) තථ්‍ය සේවක සංඛ්‍යාව තුළ අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සිටින ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිළධාරින් 13 ක්ද ද්විතිය මට්ටමේ නිලධාරින් 02 ක් ද ඇතුළත් වී තිබුණි.